**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

# විශේෂ කාර්ය බලකාය

**(ශ්‍රී ලංකා පොලීසිය)**

# ලංසු සඳහා ආරාධනා (IFB)

## විශේෂ කාර්ය බලකාය සඳහා ආයුධ, පතොරම් සහ ක්‍රීඩා සපත්තු ප්‍රසම්පාදන

01. විශේෂ කාර්ය බලකාය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපතිවරයා, පහත සඳහන් භාණ්ඩ සැපයීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවයි.

මිලදී ගැනීමට නියමිත අයිතමයන් සහ අනෙකුත් විස්තර පහත පරිදි වේ :-

| ප්‍රසම්පාදනයේ නම | ලංසු පෝරම ගාස්තුව | ඉදිරිපත් කරන ලංසුවේ වලංගු කාලය | ලංසු ඇපකරයේ වටිනාකම හා වලංගු කාලය | ලංසු භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව | පූර්ව ලංසු රැස්වීමේ දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| **විශේෂ කාර්ය බලකාය සඳහා අවි ප්‍රසම්පාදනය IFB අංකය PS/03/PB/08/04/26** | රු.44,000.00 | 2026.05.13 දින සිට 2026.08.12 දක්වා විය යුතුය. | 2026.05.13 දින සිට 2026.09.09 දක්වා වලංගු රු.4,602,000/- වටිනා ඇපකරයක් | 2026.05.13 දින පැය 1400 | 2026.04.30 දින පැය 1030 |
| **විශේෂ කාර්ය බලකාය සඳහා පතොරම් මිලදී ගැනීම IFB අංකය PS/03/PB/08/07/26** | රු.14,000.00 | 2026.05.14 දින සිට 2026.08.13 දක්වා විය යුතුය. | 2026.05.14 දින සිට 2026.09.10 දක්වා වලංගු රු. 906,000/- වටිනා ඇපකරයක් | 2026.05.14 දින පැය 1400 | 2026.04.30 දින පැය 1100 |
| **විශේෂ කාර්ය බලකාය සඳහා ක්‍රීඩා සපත්තු 7600 ක් ප්‍රසම්පාදනය කිරීම IFB අංකය PS/03/PB/08/05/26** | රු.14,000.00 | 2026.05.15 දින සිට 2026.08.14 දක්වා විය යුතුය. | 2026.05.15 දින සිට 2026.09.11 දක්වා වලංගු රු. 912,000/- වටිනා ඇපකරයක් | 2026.05.15 දින පැය 1400 | 2026.04.30 දින පැය 1130 |

02. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (තනි අදියර තනි කවර ලංසු කැඳවීමේ පටිපාටිය) යටතේ සිදු කරනු ලබන අතර අරමුදල් සපයන මූලාශ්‍රය ශ්‍රී ලංකා රජයයි.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන් හට වැඩි විස්තර ප්‍රධාන මූල්‍ය නිලධාරී, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, වෙතින් දුරකථන අංක : **0112 887396** / විද්‍යුත් ලිපිනය : **mops.procurementunit@gmail.com** මගින් ලබා ගැනීමටද, ප්‍රසිද්ධ හා බැංකු නිවාඩු දින හැර සතියේ දිනවලදී **2026.04.22** දින සිට ඉහත වගුවේ සඳහන් කළ දිනයන් හි **පැය 0900** සිට **පැය 1500** අතර කාලයේ දී මූල්‍ය අංශය, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල හිදී හෝ අපගේ නිල වෙබ් අඩවියෙන් (**www.pubsec.gov.lk**) ගාස්තු රහිතව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කළ හැකිය.

04. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරන ලද සියලුම ලංසුකරුවන්ට, අදාළ භාණ්ඩ සැපයීමට නෛතික අයිතිය තිබිය යුතුය. ලංසුකරු තම ආයතනය ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචි කර තිබිය යුතු අතර, ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවේ වටිනාකම රු. මිලියන 05 ට වැඩිනම් 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත යටතේ (Public Contract Act) ලියාපදිංචි වී තිබිය යුතුය. මෙම ලියාපදිංචි සහතිකය ලංසුව සමග ඉදිරිපත් නොකිරීම ලංසුව ප්‍රතික්ෂේප වනු ඇත. ලංසුකරුට ලැදියාවන් අතර ගැටුමක් නොතිබිය යුතු අතර ලංසුකරුගේ නම රජයේ අසාදු ලේඛනයේ සඳහන් නොවිය යුතුය. අමතර විස්තර ලංසු ලිපි ලේඛනවල ඇතුලත් කර ඇත.

05. පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කර මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද ලංසු ලිපි ලේඛන කට්ටලයක් ඉහත වගුවේ සඳහන් ආපසු නොගෙවනු ලබන ලංසු පෝරම ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් **2026.04.22** දින සිට ඉහත වගුවේ සඳහන් කළ දිනයන් දක්වා වන දින දක්වා රජයේ වැඩ කරන දිනයන්හි **පැය 0900** සිට **පැය 1500** දක්වා කාලය තුළ ලබාගත හැක. එක් ආයතනයක් සඳහා එක් ලංසුවකට එක් ලංසු පෝරමයක් පමණක් නිකුත් කරනු ලැබේ.

06. ඉහත වගුවේ සඳහන් ප්‍රසම්පාදනයන් සඳහා වෙන් වෙන්ව ලංසු ඉදිරිපත් කළ යුතු වේ. ඒ ඒ ප්‍රසම්පානයට අදාළව ලංසු පිටපත් දෙකක් සහිතව (මුල් පිටපත / අනුපිටපත) ඉහත වගුවේ සඳහන් ලංසු භාර ගැනීමේ අවසාන දිනය හා වේලාවට හෝ ඊට පෙර 17 වන මහල, “සුහුරුපාය”, බත්තරමුල්ල ලිපිනයේ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය අංශයේ තබා ඇති ලංසු බහාලනු ලබන ලංසු පෙට්ටියට බහාලීම හෝ ලංසුව විවෘත කරනු ලබන වේලාවට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් කෙළවර ඉහළ අදාළ ප්‍රසම්පාදනයේ IFB අංකය පැහැදිලිව සටහන් කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද පෞද්ගලිකව පැමිණ සිටීමට රිසි ලංසුකරුවන් හෝ ඔහුගේ නියෝජිතයින් ඉදිරිපිටදී අදාළ ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීම සඳහා සහභාගී වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් විසින් ලංසුකරුගේ ලිඛිත අවසරයක් අනිවාර්යෙන්ම රැගෙන ආ යුතුය. ලංසුකරුගේ ලිඛිත අවසරය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන කිසිදු නියෝජිතයෙකු ලංසු විවෘත කිරීම සඳහා සහභාගී කරනු නොලැබේ.

07. ඉදිරිපත් කරනු ලබන ලංසුවල වලංගු කාලය ඉහත වගුවේ සඳහන් පරිදි විය යුතුය.

08. සියලුම ලංසු, ඉහත වගුවේ සඳහන් වටිනාකමින් හා වලංගු කාලයෙන් යුත් ලංසු ඇපකරයක් සමග ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන ඇපකරය පහත කොන්දේසි යටතේ විය යුතුය.

    i. වාණිජ බැංකුවක් ලෙස මහ බැංකුවේ ලියාපදිංචි ආයතනයක් වෙතින් ලබාගත් ඇපකරයක් විය යුතුය.

    ii. ලංසු ඇපකර ආකෘති පත්‍රය ලංසු පෝරම කට්ටලයේ IV වන කොටසේ ඇතුළත් පෝරමය පරිදි විය යුතුය.

    iii. ලංසු ඇපකරය ලේකම්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය "Secretary / Ministry of Public Security and Parliamentary Affairs" නමින් විය යුතුය.

09. ඒ ඒ ප්‍රසම්පාදනය සඳහා ඉහත වගුවේ සඳහන් දින හා වේලාවේදී පූර්ව ලංසු රැස්වීමක් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාවේ දී පැවැත්වෙනු ඇත.

10. කලින් කලට වෙනස් වන මුදල් රෙගුලාසි සහ භාණ්ඩාගාරයේ උපදෙස් චක්‍රලේඛයන්ට අදාළව අවශ්‍ය සංශෝධනයන් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී සිදු කිරීම ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකළ හැකි අතර, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය ලෙසට සැලකිය යුතුය.

11. **ලංසුකරුවන්ගේ විශේෂ අවධානයට**

    ලංසු ලේඛන නිකුත් කිරීමේදී ඇතිවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා පැමිණීමට ප්‍රථම **mops.procurementunit@gmail.com** විද්‍යුත් ලිපිනයට හෝ ෆැක්ස් අංක **0112887916** වෙත අවශ්‍ය ලංසු ලේඛන පිළිබඳ තොරතුරු යොමුකර පෙර දැනුම්දීමක් සිදුකර පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

12. පහත සඳහන් ලිපිනය මගින් හෝ දුරකථන අංක මගින් මේ සම්බන්ධව වැඩිදුර විමසීම් සිදුකළ හැක.

| **ලිපිනය** | **දුරකථන අංක** |
|---|---|
| ප්‍රධාන මූල්‍ය නිලධාරී,<br>17 වන මහල, “සුහුරුපාය”,<br>බත්තරමුල්ල. | සෘජු දුරකථන අංකය : 011-2887396<br>ෆැක්ස් අංකය : 011-2887636/2887916 |

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,**
**18 වන මහල, “සුහුරුපාය”, බත්තරමුල්ල.**
**2026.04.22**

SELACINE MEDIA SOLUTIONS